## 10

# ළමා මානසිකත්වය විපරිවර්තනය කිරීමෙහිලා සමකාලීන රූපවාහිනිය සමාජ මානසිකත්ව සංස්කෘතියෙහි විප්ලවීය උපකරණයක් ලෙස.

ආචාර්ය වියුඩර් වීරසිංහ

මානව වර්ගයාගේ සමාජ පරිණාමය මූලික වශයෙන් ප්‍රධාන අවධි ත්‍රිත්වයකට බෙදා දැක්විය හැකිය. ඉන් පළමුවැන්න පූර්ව නූතන අවධිය වන අතර දෙවැන්න නූතන අවධිය වශයෙන් ද, තුන්වැන්න පශ්චාත් නූතන අවධිය ලෙස ද නම් කෙරේ. එ සේම නම් අප ඉහත නම් කරන ලද ප්‍රධාන අවධි පිළිවෙළින් සාම්ප්‍රදායික සමාජය, නූතන සමාජය සහ පශ්චාත් නූතන සමාජය ලෙස හැඳින්විය හැකිය. මේ සෑම සමාජ අවධියකටම ඊටම ආවේණික ආර්ථික, දේශපාලන, සමාජීය, සංස්කෘතික, තාක්ෂණික වෙනස්කම් පමණක් නොව ඒවාට සරිලන අධ්‍යාපනික, ශික්ෂණවාදී දෘෂ්ටිවාදී ක්ෂේත්‍ර ද නිර්මාණය වන්නේය. කෙටියෙන් සඳහන් කරන්නේ නම් ඒ ඒ සමාජවලට සරිලන ජීවන ශෛලීන් ගොඩනැගෙන්නේය. නිදර්ශනයක් වශයෙන් සාම්ප්‍රදායික සමාජයෙහි අධ්‍යාපනික සහ ශික්ෂණ පද්ධතියට වඩා නූතන සමාජයෙහි අධ්‍යාපනික සහ ශික්ෂණපද්ධතිය වෙනස් වන අතර පශ්චාත් නූතන සමාජයෙහි එය ඊටත් වඩා වෙනස් වන්නේය.

සාම්ප්‍රදායික සමාජයෙහි අධ්‍යාපනික සහ ශික්ෂණ පද්ධතිය පාදකව තිබූ මූලික සංකල්ප වූයේ පූජනීයත්වය, පාරිශුද්ධත්ව, සබුද්ධිකත්වය, උපයෝගිතාව ප්‍රමුඛ වටිනාකම් වූ අතර පශ්චාත් නූතන සමාජය තුළ ව්‍යාජත්වය, මායාකාරීත්වය.... ආදී වටිනාකම් ප්‍රධාන වේ. සාම්ප්‍රදායික සමාජයෙහි සියලු හර සහ පුරුෂාර්ථ පද්ධති නිර්මාණය වූයේ දේවත්වය හෝ අති උත්තරීතර



අධිස්වාභාවික බලවේග කේන්ද්‍ර කර ගෙනය. මෙහි සමාජ පටිපාටියම සමස්තයක් ලෙස හැඩගැසුණේ අධිකාරිත්ව බලයක් කේන්ද්‍ර කර ගෙනය.

නූතන සමාජයෙහි සෑම දෙයකම මිම්ම ලෙසට මිනිසා පත් වන අතර සියලු හර සහ පුරුෂාර්ථ පද්ධති මිනිසා කේන්ද්‍රීයව ගොඩනැගේ. මෙහි නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මානවවාදය, ප්‍රගතිය ආදී වටිනාකම් මූලික වන අතර ඒවා සියල්ල මානව කේන්ද්‍රයම අර්ථ නිරූපණය කරන්නේය. පශ්චාත් නූතන සමාජයෙහි සමස්ත හර සහ පුරුෂාර්ථ පද්ධති නූතන හෝ සාම්ප්‍රදායික අර්ථයෙන් නො පවතින්නේය. පශ්චාත් නූතන සමාජයෙහි සමාජ පටිපාටිය සහ පිළිවෙළ අවිනිශ්චිත ගතික සහ අපැහැදිලි ලක්ෂණ ප්‍රකට කරන අතර හර සහ පුරුෂාර්ථවල දක්නට ලැබෙන්නේ ද සෝදා පාළුවට සහ බාදනයට ලක් වූ ස්වභාවයකි.(වීරසිංහ; 2013) එහි සියලු මනුෂ්‍ය ධර්මතා හා සාරධර්ම අභිබවා ගිය තත්ත්වයක් නිරීක්ෂණය වන්නේය.

සංහතික මාධ්‍ය පද්ධතිය බිහි වන්නේ මානව සමාජ පරිණාමයෙහි නූතන අවධියේදී වන අතර ඒ නිසාම නූතන සමාජයේ සියලුම ගති ලක්ෂණ එයට ඇතුළත් වන්නේය. සංහතික මාධ්‍ය පද්ධතියේ ප්‍රබලතම නියෝජිතයෙකු වන රූපවාහිනිය නූතන සමාජයේ අග භාගයේ දී බිහිවුව ද එය හැඩගැසී වර්ධනය වී පරිණතභාවයට පත් වන්නේ පශ්චාත් නූතන සමාජ අවධියේ දී බව සඳහන් කළ යුතුය.

සමකාලීන රූපවාහිනී මාධ්‍ය මූලික වශයෙන් පශ්චාත් නූතන සමාජයෙහි තොරතුරු සන්නිවේදන සහ විඥාපන ක්ෂේත්‍රයේ ප්‍රබලතම උපකරණය බවට පත් වී ඇති බව පෙන්වාදිය යුතුය. ( වීරසිංහ; 2016)

පශ්චාත් නූතනවාදී සමාජය යනු ඊට පෙර පැවැති සාම්ප්‍රදායික සමාජයට සහ නූතන සමාජයට එරෙහි වූ ද එය ප්‍රතික්ෂේප කරන්නා වූ ද, සමාජ සංවර්ධනයකි. එය වෙළෙඳපොළ ක්‍රමයේ උපරි වර්ධන අවස්ථාව වන අතර පාරිභෝජනවාදී, එහි

ජීවත්වන පශ්චාත් මානවකයින්ගේ මූලික දෛනික දෘෂ්ටිවාදය බවට පත් වන්නේය.

මෙහිදී භාවිත ප්‍රයෝජ්‍ය වටිනාකම් අතික්‍රමණය කරමින් හුදු වටිනාකම, හුවමාරු වටිනාකම අධිනිශ්චිය වන්නේ මේ අනුව පශ්චාත් නූතන සමාජය යනු, ඊට පෙර පැවැති සියලු සමාජ ක්‍රමවල වූ අරමුණු පුරුෂාර්ථ, හර පද්ධති සහ පරමාදර්ශවලට පටහැනි වූද අතීතය පිළිබඳ සැලකිල්ලක් නැත්තා වූද අනාගතය පිළිබඳ අදහස් නැත්තා වූද වර්ධනය පිළිබඳව පමණක් සිතන එහි ජීවත් වන වෘත්තිය සහ මූල්‍යමය ජයග්‍රහණ අපේක්ෂා කරන්නා වූද ඒවායේ ප්‍රතිඵල සිය ජීවිතයේ අවසානයේ නොව ක්ෂණිකව අත්පත් කර ගත යුතුය යන ඇදහීම සිහි කළ පුද්ගලයෙකි. පශ්චාත් නූතන සමාජයේ විශේෂ ලක්ෂණයක් වන්නේ අරමුණුවලට වඩා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ මාර්ග ප්‍රතිසංස්කරණයක් ගෙන තිබීමය.

පශ්චාත් නූතනවාදී සමාජය යනු ඊට පෙර පැවැති සාම්ප්‍රදායික සමාජයට සහ නූතන සමාජයට එරෙහි වූද, එය ප්‍රතික්ෂේප කරන්නා වූද සමාජ සංවිධානයකි. එය වෙළෙඳපොළ ක්‍රමයේ උපරිවර්ධන අවස්ථාව වන අතර පාරිභෝජනකවාද එහි ජීවත්වන පශ්චාත් මානවකයින්ගේ මූලික දෛනික දෘෂ්ටිවාදය බවට පත් වන්නේය. මෙහිදී භාවිත ප්‍රයෝජ්‍ය වටිනාකම් අතික්‍රමණය කරමින් හුදු වටිනාකම, හුවමාරු වටිනාකම අධිනිශ්චය වන්නේ මේ අනුව පශ්චාත් නූතන සමාජය යනු ඊට පෙර පැවැති සියලු සමාජ ක්‍රමවල වූ අරමුණ, පුරුෂාර්ථ, හර පද්ධති සහ පරමාදර්ශවලට පටහැනි වූද අතීතය පිළිබඳ සැලකිල්ලක් නැත්තා වූද අනාගතය පිළිබඳ අදහස් නැත්තා වූද වර්තමානය පිළිබඳව පමණක් සිතන, එහි ජීවත් වන වෘත්තිය සහ මූල්‍යමය ජයග්‍රහණ අපේක්ෂා කරන්නා වූද ඒවායේ ප්‍රතිඵල සිය ජීවිතයේ අවසානයේ නොව ක්ෂණිකව අත්පත් කර ගත යුතුය යන ඇදහීම සිහි කළ පුද්ගලයෙකි.

පශ්චාත් නූතන සමාජයේ විශේෂ ලක්ෂණයක් වන්නේ අරමුණුවලට වඩා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ මාර්ග



ප්‍රතිසංස්කරණයක් ගෙන තිබීමය. මේ සන්දර්භය තුළ මහා යුග අරමුණු සම්බන්ධව පවත්නා උවමනාවන් පමණක් නොව, සාමාන්‍ය අරමුණු කෙරෙහි ඇති උනන්දුව පවා අඩුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. නූතන සමාජයෙහි හර පද්ධතිය පශ්චාත් නූතන සමාජය තුළ තවදුරටත් හර පද්ධතියක තත්ත්වය සහ පිළිගැනීම ලබා නොගනී. ඊට හේතුව අනාගත සමාජය පිළිබඳ පරමාදර්ශ බිඳ වැටීමයි. මේ සියල්ල ජීවිතය සහ ලෝකය පිළිබඳ ශූන්‍යවාදී, තරුම්වාදී සහ ක්ෂණවාදී ආකල්පයක් හැඩගස්වන්නේය. (වීරසිංහ, 2013) පශ්චාත් නූතන සමාජය තුළ සුඛපරමාදර්ශී මූලධර්මය පදනම් කොට ගෙන පෙරවූ ආචාරධර්ම, සාරධර්ම, සදාචාරය, සෞන්දර්යකරණයට පරිවර්තනය වේ. සමාජයෙහි මුල් තැනට සංවේදනාත්මක සහ කායික ප්‍රීතිය පැමිණේ. මිනිසා ක්‍රමානුකූලව නිර්අධ්‍යාත්මීකකරණයකට නිර්සමාජීයකරණයකට පත්ව බුද්ධිමය - ආධ්‍යාත්මික ශික්ෂණ මාදිලියක සිට තාක්ෂණික - යාන්ත්‍රික ශික්ෂණ මාදිලියන් වෙතට ගමන් කරමමින්ය.

මේ සන්දර්භය තුළ සමකාලීන ළමා පරපුර සහ රූපවාහිනී මාධ්‍යයේ අන්තර් සම්බන්ධතාව විමසා බැලිය යුතු වන බව අපගේ හැඟීමයි.

පූර්ව නූතන සමාජවල ළමා ශික්ෂණ පිළිබඳ කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කළ පවුල, පාසල, පන්සල, පල්ලිය, කෝවිල, ගුරු සහ වැඩිහිටියන් ආදී සාම්ප්‍රදායික ආයතනවල කාර්යභාරය අද්‍යතනයේදී ඉතා අවම මට්ටමකට වැටී ඇත. මෙය ප්‍රවණතාවයක් ලෙස වර්ධනය වන බව පශ්චාත් නූතන සමාජ දෙස බැලීමේදී පෙනේ.

ළමයින් සමඟ දෙමාපියන් ගත කරන කාලය, අවධානය මෙන්ම වගකීම ද අවම වන බව පෙනේ. පෙරදී දෙමාපිය, වැඩිහිටියන්, ළමයින් සමඟ සම්භාෂණයේ සමාගමයේ සහ සන්නිවේදනයේ යෙදුන කාලය සහ අවකාශය ඉතා ශීඝ්‍රයෙන් හීන වී යන බව ප්‍රකටය. මීට දශක තුන හතරකට පෙරදී සිය ළමයින් හෝ මුනුබුරු මිණිබිරියන් සමඟ ආච්චිලා, සීයලා, වැඩිහිටි, දෙමාපියන් විවිධ කතාන්දර, අත්දැකීම් සහ භාවිතයන් ඔස්සේ සම්ප්‍රේෂණය කර ගත් දැනුම, අවබෝධය, පරිචය අද ඒ

සංහතිකයින්ගේ මානසිකත්වයට බලපෑම් කිරීමේ මාධ්‍යයන්ගේ දියුණුවීමත් නිසා මිනිසුන්ගේ, සංහතිකයින් මානසිකත්වයට පෙර වූ සම්බන්ධතාව එහි ප්‍රතිවිරුද්ධ දිසාවට වෙනස් විය. (වීරසිංහ; 2016) මානසිකත්ව පැතිකඩ මගින් නිපදවන විඥාපනික නිෂ්පාදනවලට සරිලන පරිදි මිනිසුන්ගේ, සංහතිකයින්ගේ මානසිකත්වය, විඥානය වෙනස් වන්නට පටන් ගත්තේය. දූත් මානසිකත්ව පැතිකඩේ නිෂ්පාදිත (සංකල්පීය නිෂ්පාදන) තවදුරටත් මිනිසුන්ගේ මානසිකත්ව පැතිකඩේ නියමයන්ට අනුකූල නොවූ, ආර්ථික සහ රාජ්‍ය පැතිකඩවල නියමයන්ට අනුකූලව නිෂ්පාදනය ආරම්භ විය. මෙය ඇත්ත වශයෙන්ම මානව වර්ගයාගේ මානසිකත්ව පැතිකඩේ නව යුගයක ආරම්භය පමණක් යැයි ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් නොවන අතර, සත්‍ය වශයෙන්ම එය මානව සංහතිකයේ මානසිකත්ව සංස්කෘතියේ නව යුගයකි.

මේ අප ඉහත ගෙන හැර දක්වන ලද තත්ත්වය වර්තමානයේ ළමා පරපුර සහ රූපවාහිනිය අතර අන්තර් සම්බන්ධතා පැහැදිලි කිරීම සඳහා පාදක වන ක්‍රමවේදී එළැඹුමක් පමණක් නොව ඒවායේ අන්තර් සම්බන්ධතාව ගැඹුරින් අවබෝධ කර ගැනීම සඳහා වූ න්‍යායික සංකල්පීය පදනමක් ද සපයන්නේය.

සමස්ත සමාජයෙහි මානසිකත්ව පැතිකඩේ විශේෂ ක්ෂේත්‍රයක් ලෙස ළමා මානසිකත්ව පැතිකඩ සැලකිය හැකිය. ළමා මානසිකත්ව පැතිකඩට සුවිශේෂ වූ ගති ලක්ෂණ ඇති අතර ළමා මානසිකත්ව පැතිකඩ යනු මානව සමාජ පැතිකඩේ වඩාත් සංවේදී වඩාත් ගතික වඩාත් බලපෑමක් කළ හැකි පූර්ව නිශ්චිත, පූර්ව නිර්හිත දිසාවකට යොමු කළ හැකි අවධියකි. ඒ නිසා රූපවාහිනිය සමාජයෙහි මානසිකත්ව පැතිකඩේ ප්‍රබල මෙන්ම ප්‍රචලිත විඥාපන නිෂ්පාදන මාධ්‍යයක් ලෙස එය ළමා මානසිකත්වය, ළමා ශික්ෂණයට ළමා අධ්‍යාපනයට ළමා ලෝක දෘෂ්ටියට ළමා ලෝක සංවේදීතාවට ළමා ලෝකාවබෝධයට සිදුකරනු ලබන බලපෑම අති ප්‍රබල බව අවධාරණය කළ යුතුය.

පසුගිය දශක හතරක කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ, සමාජයේ, දේශපාලනයේ සහ සංස්කෘතියේ සිදුවූ ලිබරල්වාදී,



වෙළෙඳපොළවාදී ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස අප සමාජයෙහි වූ සාම්ප්‍රදායික තත්ත්වයන් සහ වැදගත් විපරිවර්තනයකට ලක් වූ අතර එය සමාජයෙහි අධ්‍යාපන, ශික්ෂණසහ දෘෂ්ටිවාදී ක්ෂේත්‍රවලට ද ප්‍රබල බලපෑමක් සිදුකොට තිබේ. විශේෂයෙන් රූපවාහිනිය ශ්‍රී ලංකාවේ ස්ථාපනය වන්නේ ලිබරල්වාදී ප්‍රතිසංස්කරණවලට සමගාමීයව සහ එහි ප්‍රමුඛ දෘෂ්ටිවාදී සහ දේශපාලන මෙවලමක් ලෙස බව අවධාරණය කළ යුතුය. ශ්‍රී ලාංකේය රූපවාහිනිය ශ්‍රී ලංකාවේ ළමා පරපුරේ මානසිකත්ව පැතිකඩ කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකරනු ලබන ප්‍රබල දෘෂ්ටිවාදී ස්ව ශික්ෂණයේදී උපකරණයක් බවට වර්තමානය වන විට පත්වී තිබේ. පශ්චාත් සාංග්‍රාමික ශ්‍රී ලාංකීය අවකාශය තුළ සංහතික මාධ්‍යයේ මෙකී ප්‍රවණතාව හෝ කාර්යය කැපී පෙනෙන අන්දමට වර්ධනය වී ඇති බව අප අවධානයට යොමු විය යුතුය. (වීරසිංහ; 2015)

රූපවාහිනිය, ළමා පරපුරට බලපාන ආකාරය පිළිබඳ ලෝක මට්ටමින් සිදුකර ඇති පර්යේෂණවල දත්තවලට අනුව වයස අවුරුදු 3 - 5 අතර ලෝක ළමයින්ගෙන් 93 දිනකට පැය හතර (04) ක් රූපවාහිනිය නරඹන බව පෙන්වා දෙන්නේය. පාසල් යන සියලුම අවුරුදුවලදී ශිෂ්‍යයෙකු පැය පහළොස් දහස් (15,000) රූපවාහිනිය නරඹන අතර පාසල් පාඩම්වලට ගත කරනු ලබන්නේ පැය එකොළොස් දහසක (11,000)කට ආසන්න ප්‍රමාණයකි. (Briggs; 2010) පාසලේ සිසුවා ගත කරන කාලයට වඩා සැලකිය යුතු කාලයක් රූපවාහිනී තිරය අභියස ගත කරන බව පෙනේ. විශේෂඥයින්ට අනුව පාසල් වයසට පෙර දරුවෙක් දිනකට පැය 4 ක් පමණ රූපවාහිනිය නරඹන බව ප්‍රකාශ කරයි. මේ තත්ත්වය ලෝක මට්ටමින් ඉතාම අයහපත් සහ අනතුරුදායක ප්‍රවණතාවකි. ඇත්තවශයෙන්ම රූපවාහිනිය දරුවාට සුවිශාල විචිත්‍ර ලෝකයකට දොර විවෘත කරනවා නොව සිදුවන්නේ එහි අනෙක් පැත්තයි. සමකාලීන රූපවාහිනිය ලෝකයට ඇති සියලුම මාර්ග වසා දමයි. මෙහි අදහස වන්නේ කුඩා දරුවාගේ මොළය ස්වභාවයෙන් ජානවිද්‍යාත්මකව නිර්මාණය වී ඇත්තේ සිය අවට පරිසරය, ලෝකය සමග සජීවී අන්‍යෝන්‍ය සම්බන්ධතා අන්තර් ක්‍රියාකාරකම් පැවැත්වීම මාදිලියකය. ආරම්භයේදී කුඩා දරුවා

හිය හැකි, එනම් අවට පරිසරය එය සම වගේ මට්ටමේ කාණ්ඩායම සමඟ නිරන්තර සහසම්බන්ධතාවක පවත්නාය විය යුතුය. එම අන්තර් ක්‍රියාකාරීත්වයෙන් තොර වූ දරුවෙකු කොපමණ සහජ බුද්ධි ප්‍රභාවයකින් උපත ලැබුව ද ඔහු සතු ශක්‍යතා ක්‍රියාවෙහි යොදා ප්‍රායෝගික විය නොහැකිය.

මෙහි අර්ථය වන්නේ අන් කිසිවක් නොව දරුවාගේ මුල්ම වසරවලදී අවට පරිසරය සමඟ සිදුවන අන්තර් ක්‍රියාවලියේදී ඔහුගේ මොළය සමඟ ස්නායු සෛලවල සම්බන්ධතා නිර්මාණය වීමට වඩා ඵලදායීව සහ කාර්යක්ෂමව සිදුවේ. විශේෂයෙන් අවට පරිසරය, අවකාශය සමඟ දරුවා ගොදෙන සහවාසිය, සම්භූය, සන්නිවේදනය, සම්භාෂණය ඒ සඳහා අතිශයින්ම වැදගත් වන්නේය. මේ ක්‍රියාවලිය මගින් දරුවා ක්‍රමයෙන් අවට පරිසරය ප්‍රත්‍යක්ෂය කර ගැනීම, දැනගැනීම, හඳුනාගැනීම සිදුවේ. රූපවාහිනිය සමඟ මෙම කාර්යය සිදු නොවේ.

දරුවෙකු රූපවාහිනිය නරඹන අවස්ථාවේදී වාචික සන්නිවේදනයේ නොයෙදේ. රූපවාහිනිය අඛණ්ඩව කතා කළත් දරුවා වාචික සන්නිවේදනයට සහභාගී නොවේ. කිසිම ප්‍රතිචාරයක් නොදක්වයි. ප්‍රශ්න අසන්නේ නැත උත්තර දෙන්නේ නැත. මදමනක් නැත. රූපවාහිනිය දෙමාපියන්ටත්, සහෝදරයන්ටත්, ගුරුවරුන්ටත් වැඩියෙන් සන්දේශ තොරතුරු පෙන්වන්නේය. එම සන්දේශ දරුවන් සිය ඥාතීන්ගේ හා සමීපතමයින්ගේ සන්දේශවලට වඩා සමහර අවස්ථාවලදී විශ්වාස කරන්නේය.

මේ රූපවාහිනියේ ප්‍රදර්ශනය කරන සියලු සන්දේශ පිළිබඳව වැඩිහිටියන් හට යම් විචාරාත්මක ඇගයීමක් සහිතව යථාර්ථය වෙන්කොට හඳුනාගැනීමට හැකි වුවත් දරුවන්ට ඔවුන් අසන ප්‍රශ්න විඥානය නිසා රූපවාහිනී තිරයෙහි සිදුවන සියලු සිදුවීම්, යථාර්ථයේ සීමා ඔවුන්ගේ දෑස් ඉදිරිපිට සිදුවන මේ මොහොතේ සිදුවන හැබෑවක් ලෙස ගනී.

රූපවාහිනී තිරයෙහි දරුවන් නිතරම දකින මිනීමැරුම් සහ ප්‍රචණ්ඩත්වය, ගැටුම් කුඩා දරුවන් තුළ පිළිකුලක් හෝ භීතියක් වූ හැඟීමක් ඇති කරන්නේ නැත. මක් නිසාද යත් දීර්ඝ කාලයක් දරුවන් රූපවාහිනිය තුළින් එම දර්ශන නැරඹීමේ ප්‍රතිඵලයක්



ලෙස ඔවුන් ඒවාට ඇබ්බැහි වී ඇති අතර රූපවාහිනී තිරය මත එම දර්ශන දැකීම ළමයින් සඳහා යථාර්ථයක් පමණක් නොව ස්වාභාවික සාමාන්‍ය දෙයකි. කුඩා දරුවන් බොහෝ විට එම රූපවාහිනී වැඩසටහන් සිය අනුකරණය සඳහා පෙළඹෙන අතර ක්‍රමානුකූලව ඔවුන් තුළ සාපරාධී ශෛලීය චින්තනයක් හැඩගැසෙන්නේය. සාපරාධී සමාජයක් සඳහා ලෝක මට්ටමෙහිලා සම්භාව්‍ය නිදර්ශනයක් වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සෑම වසරකදී ඇමෙරිකානු සමාජයේ පාසල්වල විශ්වවිද්‍යාලවල සහ ජනාකීර්ණ ස්ථානවල වෙඩි තැබීමෙන් මරණයට පත් වන සංඛ්‍යාව දහසක ඉක්මවන්නේය. මීට ප්‍රධාන හේතුව වන්නේ ඇමෙරිකානු සමාජය ව්‍යුහය සකස් වී ඇති ආකාරය වන අතර එය ඇමරිකානු සමාජය සඳහා සාමාන්‍ය තත්ත්වයක් පමණක් නොව සාමාන්‍ය දෛනික ජීවිතයේ ප්‍රමිතිය, මාදිලිය සහ ශෛලීය වන්නේය. නිදර්ශනයක් වශයෙන් ඇමරිකාවේ ලක්ෂ 3000ක් පමණ වන ජන සංඛ්‍යාව අතර නීතිවිරෝධී අය පමණක් ලක්ෂ 2500 ඉක්ම වන්නේය. (වීරසිංහ, 2016) ඇමෙරිකානු සමාජයෙහි දරුවෙක් සිය ළමා කාලය තුළ වෙඩිතබා ගැනීම්, සහ ප්‍රචණ්ඩ ලෙස මරණයට පත් කිරීම් 20000 කට වැඩි ප්‍රමාණයක් රූපවාහිනී මගින් නරඹන්නේය. ඇත්ත වශයෙන්ම මෙහිදී සිදුව ඇත්තේ ඇමෙරිකානු සමාජයට අනුකූලව එහි රූපවාහිනිය සකස්වීමකි. ළමා අවධියේ සිටම ඇමෙරිකානු සමාජයෙහි ජීවත්වීම සඳහා ළමා පරපුර තුළ සාපරාධී මානසිකත්වයක් ඇති කළ යුතුය. ඉන් තොරව එම සමාජ රටාව තුළ සාර්ථක ජීවිතයක් ගත කළ නොහැකිය යන්නයි.

ඇමෙරිකානු රූපවාහිනිය ළමා පරපුර තුළ ආධ්‍යාත්මික අභිප්‍රේරණයන් ඇති කිරීමෙන් වැළකී සිටින අතර ඒ වෙනුවට භෞතික, පාරිභෝජන ද්‍රව්‍යයන් කෙරෙහි අභිප්‍රේරණයක් ඇති කරනු ලැබේ. එය ඇමරිකානු සමාජයට ප්‍රශ්නයක් හෝ ගැටලුවක් හෝ නොවේ, එය එම සමාජයෙහි සාමාන්‍ය පැවැත්මයි. වර්තමාන ඇමෙරිකානු සමාජයෙහි පරමාදර්ශී උසස් සදාචාර අදහස් ලෙස පවතින්නේ දෙවියන් පිළිබඳ අදහසවත්, මනුෂ්‍යත්වය පිළිබඳ අදහසවත් නොව, පාරිභෝජනය, විනෝදය සහ ඒකරාශී කිරීම ආදිය පිළිබඳ අදහස්ය.

ඔවුන් ඒවා උත්තරීතර අදහස් ලෙස සලකන අතර මුළු ජීවිත කාලයම වෙහෙසෙන්නේ ඒවා අත්පත් කර ගැනීම සඳහාය. ජීවිතයේ අර්ථය ලෙස ඔවුන් දකින්නේ ඉතා ඉහළ සුඛ විහරණය යි.

සමකාලීන රූපවාහිනිය ඇතුළු දෘශ්‍ය සංස්කෘතියේ බලපෑම හේතු කොට ගෙන වසර දහස් ගණනක් තිස්සේ පැවැති වාච්‍ය කේන්ද්‍රීය සන්නිවේදනය දෘශ්‍ය කේන්ද්‍රීය සන්නිවේදනයක් දක්වා පරිවර්තනය වී ඇත. කුඩා කළ සිට ළමා පරපුර මේ දෘශ්‍ය රූප කේන්ද්‍රීය සංස්කෘතිය තුළ ශික්ෂණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් තාර්කික සහ විචාරාත්මක විනීත සහ සරල දෘශ්‍ය පෘෂ්ටිය චින්තනයක් දක්වා ලඝු වන්නේය. මේ තත්ත්වය ළමයින්ගේ නිර්මාණාත්මක සහ බුද්ධිමය ශක්‍යතා වර්ධනය කෙරෙහි බලපාන්නේය.

එසේම දීර්ඝ කාලයක් ළමයින් රූපවාහිනිය නැරඹීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරුවන්ගේ භාෂණ සහ කථන ශක්‍යතා වර්ධනය කෙරෙහි තීරණාත්මක බලපෑමක් සිදුකරනු ලැබේ. කුඩා දරුවන් රූපවාහිනිය නැරඹීම සම්බන්ධව ලෝක මට්ටමින් සිදුකරන ලද පර්යේෂණවලට අනුව අවුරුදු හතරක් (4) වයස ඇති දරුවන්ගෙන් 25% කට භාෂණ සංවර්ධන විකෘතිතා නිරීක්ෂණය වී තිබේ. 70 දශක මැත භාගයේදී එම ප්‍රතිශතය 4% පමණක් වී තිබේ.

රූපවාහිනිය සහ දරුවාගේ කතාව, භාෂණය අතර සම්බන්ධ පිළිබඳ යමෙකු ප්‍රශ්න කළ හැකිය. ප්‍රශ්නය වන්නේ රූපවාහිනී තිරය ඉදිරිපිට සිටින දරුවා නිරතුරුවම කතාව, භාෂණයට සවන් දී ගෙනසිටී. මෙය දරුවාගේ භාෂණයේ සහ කතාවේ මර්ධනයට ආධාරක නොවන්නේද? දරුවා සමඟ කතා කරන්නේ වැඩිහිටියෙකු ද කාටූන් චිත්‍රපටයේ ප්‍රධාන වීරයාද යන්න ඇත්තේ කුමන වෙනසක්ද? මෙහි සුවිශාල වෙනසක් පවතී. කතාව යනු අනෙක් අයගේ වචන අනුකරණයක් නොවේ. එය කතා මුද්‍රා, ස්මරණයක් ද නොවේ. දරුවාගේ කතාව, භාෂණය සංවර්ධනය වන්නේ සෘජු, සජීවී, සංක්‍රීය සම්බන්ධතා පද්ධතියක් තුළය. කුඩා දරුවා අනෙකාගේ කතාවට සවන් දෙනවා පමණක් නොව ඊට



ප්‍රතිචාර ද පිළිතුරු ද දෙන්නේය. දරුවා එහිදී දෙබස් අවකාශයකට ඇතුළු වන්නේය.

එතුළ පමණි මානව භාෂණය, කතාව සංවර්ධනය වන්නේ. බාහිර කතාව එය මානව භාෂණයේ, කතාවේ ඉතා මතුපිට කොටසක් පමණි. ඊට පිටුපසින් අතිවිශාල සංකීර්ණ ක්‍රියාවලියක් සිදු වන්නේය. අභ්‍යන්තර භාෂණය යනු සංකීර්ණ වූ ද බහුමානීය වූද ප්‍රපංචයකි. කෙසේවෙතත් කතාව හෝ භාෂණය යනු සන්නිවේදනයේ හෝ සමාශ්‍රයේ මාධ්‍යයක් පමණක්ම නොවේ. එය චින්තනයේ ද මාධ්‍යය වන්නේය. එය පරිකල්පනයේ සහ ස්වකීය චර්යාව උපාර්ජනය කර ගැනීමේ මාධ්‍යයකි. එය ජීවිත සහනුභූතින් පසක් කර ගැනීමේ මාධ්‍යයකි.

එය අවසාන වශයෙන් තමාම අවබෝධ කර ගැනීමේ මාධ්‍යයකි. අභ්‍යන්තර භාෂණය තුළ සිදු වන්නේ චින්තනය පමණක් නොව පරිකල්පනය ද, සහනුභූතිය ද, සහ වේදනය ද ඇතුළුව මිනිසාගේ සමස්ත ආධ්‍යාත්මික, ජීවිතය ද වන්නේය. මිනිසා සිය භාෂණය මගින් සිය අභ්‍යන්තර ලෝකයෙහි නිරතුරු චින්තන යුද්ධයක යෙදී සිටින මිහි මත ජීවත් වන එකම සත්ත්වයා මිනිසාය.

අතීතය ගැන ස්මරණය කරමින් ද අනාගතය ගැන සිතමින් ද, අහිමි වූ දෑ ගැන අසතුටු වෙමින් ද බාහිර ලෝකගතිකවලට සහ විචල්‍යයන්ට සමගාමීව සිය මානසික ලෝකය සංතුලනය කර ගනිමින්ද මිනිසා තමා සමග නිරන්තර සංවාදයක යෙදී සිටියි. මිනිසා තුළ ස්ථිරසාරභාවය සහ ස්වාධීනත්වය සහතික කරමින් ඕනෑම දෙයක් අල්ලා ගැනීමේ අභ්‍යන්තර ස්වරූපය ලබා දෙන්නේ මිනිසා තමා සමග සිදුකර ගන්නා සංවාදය මගිනි. යම් පුද්ගලයෙකු තුළ මෙම අභ්‍යන්තර ස්වරූපය වර්ධනය වී නොමැති නම් එ නම් අභ්‍යන්තර භාෂණය නොමැති නම් පුද්ගලයා තුළ අස්ථිරතාවක් පරාධීනත්වයක් බාහිර බලවේග මත රඳා පැවැත්මක් සහ බාහිර බලවේගවල බලපෑමට ඉතා පහසුවෙන් ලක්වීමක් සිදු වන්නේය. මේ තත්ත්වය තුළ පුද්ගලයාට යම් දෙයක් දරා

ගැනීමට හෝ යම් නිශ්චිත අරමුණක් කරා ගමන් කිරීමට හෝ හැකියාවක් නැත.

වර්තමානයේ අප අතර ජීවත්වන බොහෝ දරුවන්ට මෙම අභ්‍යන්තර ස්වරූපය, අභ්‍යන්තර කතාව, භාෂණ නොමැති වීම සුලභ තත්ත්වයකි. මෙම තත්ත්වය සමකාලීන රූපවාහිනී සංස්කෘතියේ සෘජු ප්‍රතිඵලයක් බව අවධාරණය කළ යුතු වේ. ඒ අනුව සමකාලීන රූපවාහිනී සංස්කෘතියේ බලපෑමට ලක් වී සිටින බොහෝ ළමයින්ගේ ළමා භාවය ඔවුන්ට අහිමි කර ඇති අතර ළමා භාවයෙන් තොර ළමා පරපුරක් බිහිවෙමින් පවතී. මෙය අවසානයේදී මනුෂ්‍යත්වයෙන් තොර මිනිසෙක් පමණක් මිනිසෙකු බිහිකරනු ලැබේ. සමකාලීන රූපවාහිනිය යනු මූලික වශයෙන් අර්ථ රහිත සංහතික මාධ්‍යයකි. එහි අඩංගු තොරතුරු ද අන් කිසිවක් නොව අර්ථ රහිත දැනුමකි. ඒ නිසා සමකාලීන රූපවාහිනී සංස්කෘතියෙන් නිර්මාණය වන ළමා පරපුර ද ලෝකය, සමාජය, ජීවිතය පිළිබඳව පමණක් නොව තමා පිළිබඳවම ද අදහසක් නැති අරමුණක් නැති, පරාරෝපිත පමණක් ළමා ලෝකයකි.

ගෝලීය වශයෙන් ව්‍යාප්තවන මෙම ප්‍රවණතාවට මුහුණදීම සඳහා අවම වශයෙන් ජාතික තලයෙහි පැහැදිලි නිශ්චිත සහ සක්‍රිය සංස්කෘතික, දේශපාලන වැඩපිළිවෙළක් නිර්මාණය කර ගත යුතුය. එහිදී සමාජයෙහි මානසිකත්ව පැතිකඩ සංයුක්ත කරන අධ්‍යාපනය, සංස්කෘතිය, සංහතික මාධ්‍ය, සංස්කෘතික දේශපාලන ආකෘතියක් තුළ ඒකීය සමස්තයක් ලෙස කටයුතු කළ යුතුය.



## ආශ්‍රිත ග්‍රන්ථ


1. (වීරසිංහ, විපුඩර් 2013) ගෝලීය සමාජය සහ එහි දෘෂ්ටිවාදය නොතැන්න පබ්ලිෂින් හවුස්, ආණමඩුව.

2. වීරසිංහ, විපුඩර් (2016) සංයුතාංග රූපවාහිනිය උපරි සමාජ දෘෂ්ටිවාදී උපකරණයක් ලෙස එහි ඓතිහාසික පරිණාමය සහ විශේෂතා රූපවාහිනී සමීක්ෂා කලාවකට පාදක මාධ්‍ය ශිල්පයන තාක්ෂණ ප්‍රවණතා සංස්: සෙනෙෂ් දිසානායක බණ්ඩාර, ස්වැන්ලි හෙට්ටිආරච්චි, නන්දසේන පලිහක්කාර සහ පී. ඒ. පිනග්‍රිය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

3. වීරසිංහ, විපුඩර් (2016)සිවමාන - ජාතික සහ ගෝලීය ප්‍රවණතා පිළිබඳ විචාරාත්මක පර්යාලෝක නොතැන්න පබ්ලිෂින් හවුස්, ආණමඩුව.

4. වීරසිංහ, විපුඩර් (2015) පශ්චාත් සාංග්‍රාමික ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මාධ්‍ය සංස්කෘතිය, සමාජ සහ සංහතික පාලනයේ නව උපකරණයක් ලෙස ජනමාධ්‍යවේදය: ජනමාධ්‍ය අධ්‍යයන සහ විචාර - මාධ්‍ය සංස්කෘතිය, සංස්: ධර්ම කීර්ති ශ්‍රී රන්ජන්, රන්ජන් හෙට්ටිආරච්චි සහ පුගත් සෙනරත්, මාධ්‍ය පර්යේෂණ අංශය, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

5. Briggs Matt (2010), Television, Audiences and Everyday life, Tata Megraw Hill Education PL, New Delhi.